# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2036/4 - 2017 සැප්තැම්බර් මස 11 වැනි සඳුදා - 2017.09.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩපොල ඕතොට කෝරලේ සුළු කොට්ඨාසයේ කහදිවෙල ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන සකස් කරන ලද කු. 2369 හා 2017.08.14 දිනැති මූලික පිඹුරේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ල.

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: කෙහෙල් ඇල්ලේකුඹුර; හිමිකම් කියන්නන්: අංක 110, ඔරුලියද්ද, පොල්ගහවෙල ලිපිනයේ පදිංචි එම්. ටී. එම්. තව්පික්, අංක 208, කැගල්ල පාර, පොල්ගහවෙල පදිංචි එම්. එස්. මොහමම්මදු, අංක 15, ඔරුලියද්ද, පොල්ගහවෙල ලිපිනයේ පදිංචි එස්. සහබ්දීන්; ප්‍රමාණය: හෙක්. 0.3023

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 සැප්තැම්බර් මස 27 දින පෙ.ව. 10.00ට පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2017 සැප්තැම්බර් මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඩී. අනෝමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
පොල්ගහවෙල.

2017 සැප්තැම්බර් මස 07 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 661

1A - G 26242 - 27 - (2017/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය* : නුඑ/3/1/8/අත්පත්/111/18ඊ.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : එල්ඩී/05/2006/ සීඊබී/278ඊ.

අංක 1693/6 හා 2011.02.14 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* III කොටසේ 3ඒ පිටුවේ පළ කරන ලද 7 වැනි වගන්තිය දැන්වීමේ අංක 50 හි කැබලි අංක 50 සඳහා 9ඒ පිටුවේ සඳහන් අවසාන ඡේදය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරමි.

"ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් බලයලත් අයවලුන් හෝ 2017 ඔක්තෝබර් මස 16 වැනි දින පෙ.ව. 10.00ට නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද 2017 ඔක්තෝබර් මස 09 දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තර කර වන්දි මුදල හා ඒ වන්දි මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් 2ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය."

එස්. පී. කේ. බෝධිමාන්න,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2017 අගෝස්තු මස 30 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 – 662

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.